# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk


2025.03.07 මාධ්‍ය නිවේදන අංක: 2025/021/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු. 20,000/- ක (රුපියල් විසිදහසක) මුදලක් අල්ලස් වශයෙන් පිරිනැමීම සහ එයට ආධාර අනුබල දීම යන අල්ලස් චෝදනා මත සිවිල් පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට</u>**

නිකවැරටිය පොලිස් ස්ථානයේ සැරයන්වරයකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව, පැමිණිලිකරු රාජකාරි කරනු ලබන නිකවැරටිය මූලස්ථාන පොලිස් ස්ථානයේ නොවිසඳුණු අපරාධ විමර්ශන අංශය මඟින් සිදු කරනු ලබන ගව සොරකම් කිරීමේ සිද්ධියකට අදාළව අවශ්‍ය කරනු ලබන සැකකරුවන් දෙදෙනෙකු එම අපරාධයේ සැකකරුවන් ලෙස නම් නොකර සාක්ෂිකරුවන් වශයෙන් නම් කරන ලෙසට ඉල්ලා ඒ වෙනුවෙන් රු. රු. 20,000/- ක (රුපියල් විසිදහසක) මුදලක් අල්ලස් වශයෙන් පිරිනැමීම සහ එයට ආධාර අනුබල දීම යන චෝදනා මත දඹදෙණිය සහ අලව්ව ප්‍රදේශයේ පදිංචි සිවිල් පුද්ගලයින් දෙදෙනෙකු 2025.03.06 වන දින ප.ව.4.00 ට පමණ නිකවැරටිය පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති ග්‍රොසරි වෙළඳසැලක් තුළ දී හා පොලිස් ස්ථානයේ ප්‍රධාන ගේට්ටුව අසල දී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් නිකවැරටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය**
0112502672